

# අලි සම්පත වනසන හක්කපටස් වලට එරෙහි වෙමු!

## හක්කපටස්

ශ්‍රී ලංකාවේ අලි මරණ අතුරින් 20-25% කට හේතු සාධක වී ඇත්තේ හක්කපටස් බව හෙළිවී ඇත. හක්කපටස් යනු තුවක්කු කුඩු, ගල්, ර්‍යම් සහ යකඩවලින් සාදන ලද කුඩා පුපුරන ද්‍රව්‍යයකි. ප්‍රධාන වශයෙන් ග්‍රාමීය කෘෂිකාර්මික ගම්මාන වල ගොවීන් විසින් වන සතුන්ගේ තම වගාවන් ආරක්ෂා කිරීමට හක්කපටස් යොදාගනු ලබන මෙම පුපුරණ ද්‍රව්‍යයට අලින් අද වන විට ගොදුරක් බවට පත්ව ඇත. අලින් සැරිසරන පෙදෙස්වලට උපක්‍රමශීලීව හක්කපටස් මිශ්‍ර කිරීමත්, ආහාරය සමඟ හක්කපටස් ගිල දැමීමත් හේතුවෙන් බොහෝ වනජීවීන් ඉතා අමානුෂික ලෙස ඝාතනයට ලක්වී ඇත. මුඛයට හානි වීම හේතුවෙන් මෙම සතුන් ආහාර ගැනීමට නොහැකිව දීර්ඝ කාලයක් දුක් වේදනා විඳීමෙන් අනතුරුව මරණයට පත්වේ.

## අලි - මිනිස් ගැටුම

දිනෙන් දින සිදුවන වනාන්තර එළි කිරීම නිසාත්, මිනිසුන් විසින් වනාන්තර ආශ්‍රිත ප්‍රදේශ වල තම වාසස්ථාන සාදාගැනීම, වගා බිම් සාදාගැනීම හේතුවෙන් අද වන විට අලි මිනිස් ගැටුම් උග්‍ර වී ඇත. තවද, මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් අලින්ගේ ස්වභාවික වාසස්ථානද බොහෝ ලෙස සීමාවී ඇත. අලින් පලවා හැරීමට මිනිසුන් විසින් විවිධ උපක්‍රම භාවිතා කරයි. ඒ අතර විදුලි වැටවල් බැඳීම, හක්කපටස්, මදු ගැසීම හා වෙඩි තැබීම ඒ අතර ප්‍රධාන වේ. එයට අමතරව දුම්රිය ගැටීම, වගා ළිං වලට වැටීම ආදී වෙනත් හේතුන්ද අලි මරණ අනුපාතය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

**ඔබ දන්නවාද?**

**වාර්ෂිකව අලි මරණ 236 ක් පමණ සිදුවේ.**

**ඒ අතරින් 45 - 50 ත් අතර ප්‍රමාණයකට හක්කපටස් හේතුවී ඇත.**

## ශ්‍රී ලංකාවේ අලි සම්පත

ශ්‍රී ලංකා අලියා, ආසියානු අලින්ගේ විශේෂයට අයත් විශාලතම උප විශේෂයකි. සංරක්ෂණය සඳහා වන අන්තර්ජාතික ආයතනය (IUCN) මගින් තර්ජිත විශේෂයක් වශයෙන් ශ්‍රී ලංකානු අලියා හඳුනාගෙන ඇත. 2011 වසරේදී සිදු කළ අලි සමීක්ෂණයේදී දිවයින තුල අලි ඇතුන් ආසන්න වශයෙන් 5879 ක් පමණ වාසය කරන බවත් ඒ අනුව සමස්ථ ඇත් ගහනය 6.5% පමණ වන බවත් ඇස්තමේන්තු කර ඇත. ශ්‍රී ලංකා අලි ගහනය වියලි කලාපයට, ජාතික වනෝද්‍යාන සහ අභය භූමි වලට සීමා වී ඇත. ඒ අතර උඩවලව ජාතික වනෝද්‍යානය, මින්නේරිය ජාතික වනෝද්‍යානය, විල්පත්තු ජාතික වනෝද්‍යානය, යාල ජාතික වනෝද්‍යානය ආශ්‍රිතව අලි ඇතුන් බහුලව දකගත හැකිය.

### දැනට ක්‍රියාත්මක නීතිමය තත්ත්වය පිළිබඳ ඔබ දැනුවත්ද?

*1937 අංක 02 දරණ වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (2009 අංක 22 දරණ සංශෝධිත) 21-2-(අ)-(ආ) වගන්තිය ප්‍රකාරව අලියෙකු මැරීම හෝ හානි කිරීම අවමය රු.150,000 ට හා උපරිමය රු.500,000 ක් දක්වා දඩයකට හෝ අවුරුදු 02 සිට 05 දක්වා සිරදඬුවමක් නියම කළ හැකි වරදකි.*

- **වන සතුන් මැරීමට හක්කපටස් භාවිතා කරන අයවළුන් ඉහත නීතිය පිළිබඳව දැනුවත් කරන්න.**
- **එසේ ලඟ තබාගන්නා පුද්ගලයින් පිළිබඳ පහත සඳහන් දුරකථන අංක වෙත දැනුම් දෙන්න.**

**# පොලිස් හදිසි ඇමතුම් ඒකකය - 119**
**# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව - 1992**
**# පරිසර යුක්ති කේන්ද්‍රය - 071-0369000**

මිනිසා විසින් හක්කපටස් යොදාගෙන සිදුකරන අමානුෂික අපරාධ වලට එරෙහි වීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව ක්‍රියා කිරීමට පරිසර යුක්ති කේන්ද්‍රය සූදානම්ව ඇත.

## ඒ සඳහා ඔබත් සහය වන්න!

*පරිසර යුක්ති කේන්ද්‍රය*
20A, කුරුප්පු පාර, කොළඹ 08